සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
**Department of Divineguma Development**

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය / எனது இல. / My No: DDD/HO/07/06/ID /සිසු දිරිය
ඔබේ අංකය / உமது இல / Your No: ...................
දිනය / திகதி / Date: 2016.08.15

සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල් / දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>ජාත්‍යන්තර සාක්ෂරතා දින වැඩසටහන - 2016</u>**

සෑම වසරකම සැප්තැම්බර් මස 08 වන දිනට යෙදෙන ජාත්‍යන්තර සාක්ෂරතා දිනය නිමිති කර ගෙන දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමාජ සංවර්ධන අංශය මගින් විවිධ වූ වැඩසටහන් දියත් කරනු ලැබේ.

02. ඒ අනුව 2016 වසරේ සැප්තැම්බර් මස 08 වන දිනට යෙදෙන ජාත්‍යන්තර සාක්ෂරතා දිනය නිමිති කොට ගෙන දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් අවම වශයෙන් සිසු දිරිය ශිෂ්‍යත්ව 10 ක් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

03. මෙම ශිෂ්‍යත්ව සමාජ සංවර්ධන පදනමේ දායකත්වය මත හෝ කැපකරු මාපිය ක්‍රමය යටතේ ලබාදිය හැකිය. 2016/06 සමාජ සංවර්ධන චක්‍රලේඛයෙන් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ජාත්‍යන්තර දින සැමරීම උදෙසා මේවන විටත් රුපියල් 18,000/- ක මුදලක් යොමු කර තිබෙන අතර වැඩසටහන් සංවිධානය කර ගැනීම සඳහා එම මුදල් භාවිතා කළ හැකිය.

04. වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය සම්බන්ධව දිස්ත්‍රික් මට්ටමින් සකස් කරන ලද තොරතුරු මේ සමග අමුණා ඇති ඇමුණුම් අංක 01 අනුව ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

05. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

චන්ද්‍රා වික්‍රමසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.